# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 40 වැනි කාණ්ඩය | ඔක්තෝබර් 2023

## ආබාධ සහිත පුද්ගලයින් පාර්ලිමේන්තුවේ සංචාරයක



ආබාධ සහිත පුද්ගල සංවිධාන එකාබද්ධ පෙරමුණේ දිවයින පුරා එකාබද්ධව සිටින ශ්‍රවණ, දෘශ්‍ය හා ශාරීරික ආබාධ සහිත පිරිසක් මෑතක පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක නිරතවූහ.

# අන්තර්ගතය

## පුවත්

- ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ වාර්ෂික හමුව - 2023

- අනාගතය උදෙසාවූ සාධනීය අදහස් හා යෝජනා, කෙටුම්පත් ලෙස ශිෂ්‍ය පාර්ලිමේන්තු ඔස්සේ ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කරන්න පුළුවන් - ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා

- ඇගැයීම් උපයෝගී කර ගනිමින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පාර්ලිමේන්තුවේ කාර්යභාරය ශක්තිමත් කිරීම ඉතා වැදගත් - නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා

- විවෘත පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ ජ්‍යේෂ්ඨ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ විශේෂ වැඩමුලුවක් අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන්

- ආබාධ සහිත පුද්ගලයින් පාර්ලිමේන්තුවේ සංචාරයක

- සෙයියඩ් අලි සාහිර් මෞලානා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දෙයි

- වාර්ෂික සන්නද්ධ හමුදා අණුස්මරණ දිනයට සමගාමීව පොපි මල පැළඳවීම පාර්ලිමේන්තුවේදී

- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ කාර්යමණ්ඩලයට පුහුණු වැඩසටහනක් පාර්ලිමේන්තුවේදී

- ශ්‍රී ලංකාවේ උත්තරීතරම ආයතනයේ පුහුණුවක් ලැබීමට අවස්ථාව ලැබීම විරල අවස්ථාවක්, උපරිම දැනුම ලබා ගන්න - පාර්ලිමේන්තුවේ වැඩ බලන මහලේකම් චමින්ද කුලරත්න මහතා නවක සීමාවාසිකයින් හමුවේ පවසයි.

- තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම, ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවලට අතිශයින් අභියෝගාත්මකයි - කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා

- බත්තරමුල්ල ඒම්.ඩී.එච් ජයවර්ධන මහා විද්‍යාලයේ ප්‍රථම ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම වැඩබලන පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන්

## කාරක සභා පුවත්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් යෝජිත ව්‍යාවසායකත්ව සංවර්ධන විද්‍යායතනය, කුරුණෑගල, ටෙක්නො පාර්ක් (Techno Park) පරිශ්‍රයේ පිහිටුවීමට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) නාමල් රාජපක්ෂ මහතාගෙන් යොජනාවක්.

- දරුවන් සිගමනට යොදා ගැනීම නතර කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමට විශේෂ කමිටුවක්

- තිරිඟු පිටි ගැටලුව සම්බන්දයෙන් ව්‍යවහාරික විගණනයක් පවත්වන්න - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවට උපදෙස්

- ප්‍රමුඛතාව මත මහා මාර්ග නඩත්තු කටයුතු සහ නැවතී ඇති මාර්ග ව්‍යාපෘති නැවත ආරම්භ කරනවා - අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පවසයි



# පත්තලය

- දේශීය පයිනස් දැව නිෂ්පාදනය සඳහා වන පිරිවැය අඩුකර ගැනීමට පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන්ට උපදෙස්.

- අංක 2340/45 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කළ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය යටතේ නියමය අහෝසි කිරීමට මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය.

- දුම්වැටි හා මත්පැන් වලින් ආණ්ඩුව උපයන මුදල මෙන් තුන් ගුණයක් මත් උවදුරට ගොදුරුවූ පුද්ගලයින්ට ප්‍රතිකාර වෙනුවෙන් වැය කරනවා - සෞඛ්‍යය විශේෂඥයින් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී හෙළිකරයි.

- විදේශ ආයෝජනයන්ට, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනට බාධා වන ගැටලු හා නව ආයෝජන අවස්ථා හඳුනාගන්න අදාළ සියලු පාර්ශව සමග සම්බන්ධීකරණයෙන් යාන්ත්‍රණයක් හදන්න - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) නාමල් රාජපක්ෂ මහතාගෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයට උපදෙස්.

- වසර ගණනාවක් තිස්සේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පවතින සේවක පුරප්පාඩු පිරවීමේ ගැටලුව විසඳීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මැදිහත් වෙයි.

- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරිපාලන දුර්වලතා රැසක්! - අක්‍රමිකතා පිළිබඳවත් කෝප් කමිටුව විමර්ශනය කරයි

- කොළඹ නගරය විටින් විට ජලයෙන් යට වී ජලය පිටාර ගැලීමේ ගැටලුව පිළිබඳ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ අවධානය

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගොස් සිටින නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ලබාදීමේදී පවතින ගැටලුව සති දෙකක් තුළ විසඳන්න - විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට උපදෙස්.

- ළමා මන්ද පෝෂණය සම්බන්ධව රාජ්‍ය ආයතන ඉදිරිපත් කරන තිබෙන සංඛ්‍යාමය වාර්තා වලින් රටේ පවත්නා සැබෑ තත්ත්වය අනාවරණය වෙන්නේ නැහැ - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වඩිවේල් සුරේෂ් මහතා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී පවසයි

- ශ්‍රී ලංකාවේ ජාතික උරුමයන් සුරැකීම උදෙසා කඩිනමින් ක්‍රියාත්මක වීමට වැඩ පිළිවෙලක් අවශ්‍යයි - මහා සංඝරත්නය ඇතුලු පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ස්වෙච්ඡා සංවිධානවල ප්‍රධානීන් ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මවීම පිණිස වන පාර්ලිමේන්තු සංසදය හමුවේ පවසයි



පුවත්

# ආබාධ සහිත පුද්ගලයින් පාර්ලිමේන්තු සංචාරයක



ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ද පෙරමුණේ දිවයින පුරා ඒකාබද්ධව සිටින ශ්‍රව්‍ය, දෘශ්‍ය හා ශාරීරික ආබාධ සහිත පිරිසක් මෙමස පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක නිරතවූහ.

ඒ පාර්ලිමේන්තු ක්‍රියවලිය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට මෙන්ම පාර්ලිමේන්තු මහජන නියෝජිතයින් මුණගැනීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මහලේකම් කුෂානි රෝහණධීර මහත්මියගෙන් සිදුකළ ඉල්ලීමට අනුවයි.

මෙහිදී පාර්ලිමේන්තු සන්නිවේදන දෙපාර්තමේන්තුවේ, මහජන සේවා අංශය විසින් එම පිරිසට පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව අවශ්‍ය දැනුවත්කිරීම් සිදුකරන ලදී.

පසුව මෙම පිරිස, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩලස් අලහප්පෙරුම මහතා හමුවී සුහද සාකච්ජාවක නිරතවූහ. එහිදී එම පිරිස තම ප්‍රජාවට මුහුණ දීමට සිදුවන ගැටලු හා අභියෝග පිළිබඳ කරුණු ඉදිරිපත් කළහ. එම පිරිස සිහිපත් කළේ ඔවුන්ට අවශ්‍ය වන්නේ සමාජයතුළ විශේෂ අවස්ථා නොව සම අවස්ථා බවයි.

වර්තමානය වන විට ආබාධ සහිත ප්‍රජාවට අවශ්‍ය දේ සැපිරීම හා සම අවස්ථා ලබාදීම වෙනුවෙන් සමාජ තුළ කවරදාටත් වඩා කතිකාවක් නිර්මාණය වීම සුභදායක බව මෙහිදී කරුණු දක්වමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩලස් අලහප්පෙරුම මහතා පැවසීය.

මේ අවස්ථාව සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ නියෝජ්‍ය සම සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) මධුර විතානගේ, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජයන්ත සමරවීර හා මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක යන මහත්වරුන් මෙන්ම ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ද පෙරමුණේමේ සාමාජිකන් පිරිසක් සහභාගී වී සිටියහ.

නිරීක්ෂණ චාරිකාවෙන් අනතුරුව එම පිරිස සමූහ ඡායාරූපයකට පෙනී සිටි අතර මේ අවස්ථාව සඳහා ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාද සහභාගී සහභාගි විය.

# ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ වාර්ෂික හමුව - 2023



2023 ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ වාර්ෂික හමුව පසුගියදා කොළඹදී ආරම්භ විය. එහි සමාරම්භක උත්සවය මේ මස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී පවත්වන ලදී."ආසියාවේ පාර්ලිමේන්තුවල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තුල සමාන ප්‍රවේශයන් ඇති කිරීම සහ විවිධත්වය"යන්න තේමා කරගනිමින් මෙවර ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසද හමුව පැවැත් විය

මෙම හමුවේ සමාරම්භක අවස්ථාව සඳහා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන, ගරු නියෝජ්‍ය කථානායක අජිත් රාජපක්ෂ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්න, සහකාර මහලේකම් හංස අබේරත්න යන මහත්ම මහත්මීන් ද, ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජිකාවන්, විදෙස් රටවල් කිහිපයක රාජ්‍ය නිලධාරීහු ඇතුළු පිරිසක් සහභාගී වී සිටියහ.

යුද්මය තත්ත්වයන් ඇතුළුව කාන්තාවන්ට එරෙහිව ලොවපුරා මතුව තිබෙන විවිධ වූ හිංසන වලට එරෙහිව නැගීසිටීමේ වැදගත්කම මෙන්ම ලෝකය තුල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීමේ වැදගත්කම පිළිබඳවද සහභාගිවූ නිලධාරීහු අදහස් දැක්වූහ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය නිර්මාණය කිරීම ඔස්සේ මෙරට කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා ලබාගත් ප්‍රතිපත්තිමය තීරණ හා සිදුකළ සේවාවන්ද මෙහිදී සිහිපත් කෙරිණි.

2023 ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ වාර්ෂික හමුව සාර්ථක කරගැනීමට දැක්වූ දායකත්වය වෙනුවෙන් ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර, යන මහත්ම මහත්මීන් සඳහා සමරු තිළිණ ලබාදීමද සිදු කෙරිණි.

පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවකට එක් වූ ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජිකාවන් ඇතුළු පිරිස, සමූහ ඡායාරූපයකටද පෙනී සිටියහ. අනතරුව ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජිකයින්, මැතිවරණ කොමිෂන් සභාවට ගොස් එහි සාමාජිකයින් සහ සිවිල් සංවිධාන නියෝජිතයින් හමුවී සාකච්ඡා පැවැත්වූහ.

# අනාගතය උදෙසාවූ සාධනීය අදහස් හා යෝජනා, කෙටුම්පත් ලෙස ශිෂ්‍ය පාර්ලිමේන්තු ඔස්සේ ව්‍යවස්ථාදායකයට ඉදිරිපත්කරන්න පුළුවන් - ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ



**රටේ ජීවනාලිය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවයි - කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා රත්නපුර සීවලී මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල සභාවාරය ආරම්භ කරමින් පවසයි.**

අනාගතය උදෙසාවූ සාධනීය අදහස් හා යෝජනා කෙටුම්පත් ලෙස ශිෂ්‍ය පාර්ලිමේන්තු ඔස්සේ ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කිරීමට සිසු දරුවන්ට අවස්ථාව පවතින බව ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැවසුවේය. වැඩිදුරටත් අදහස් දක්වමින් ජනාධිපතිවරයා මෙරට සියලු ශිෂ්‍ය පාර්ලිමේන්තු, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හා සම්බන්ධ කරමින් කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දුන්නේය.

ජනාධිපතිවරයා මේ බව පැවසුවේ මේ මස ජනාධිපති ලේකම් කාර්යාලයේදී, ගරු කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර, ජනාධිපති ලේකම් සමන් ඒකනායක, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්න, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් හංස අබේරත්න යන මහත්ම මහත්මීන්ගේ සහභාගිත්වයෙන් පැවති රත්නපුර සීවලී මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල සභාවාරයේ සමාරම්භක අවස්ථාවට එක්වෙමිණි.

රත්නපුර දිස්ත්‍රික්කයේ සීවලී මධ්‍ය මහා විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම අරමුණු කොටගෙන ජනාධිපති ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව එක්ව මෙම වැඩසටහන සංවිධානය කෙරිණි.

ඒ අනුව රත්නපුර සීවලී මධ්‍ය විද්‍යාලයී ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල සභාවාරය අරඹමින් කථානායකවරයා, අග්‍රාමාත්‍යවරයා,අමාත්‍ය මණ්ඩලය තෝරාපත්කර ගැනීම සිදුවුණි. අනතුරුව අග්‍රාමත්‍යවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලය හා මන්ත්‍රී කණ්ඩායම දිවුරුම් දුන්හ.



මෙහිදී සභාව අමතමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා, මෙරට ජීවනාලිය ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව බව ප්‍රකාශ කළේය. පාර්ලිමේන්තුව නොමැති රටක සියලු කටයුතු සම්පූර්ණයෙන් අක්‍රීය වන බව ප්‍රකාශ කළ කථානායකවරයා ශිෂ්‍ය පාර්ලිමේන්තු මගින් පාර්ලිමේන්තු ක්‍රියාවලිය හා එහි පවතින වටිනාකම් ගැන මනා වැටහීමක් ලබාගත හැකි බව පෙන්වා දුන්නේය.



එමෙන්ම ශිෂ්‍ය අවධියේ සිට පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව දැනුවත්වීමේ වැදගත්කම පැහැදිලි කරමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂාණි රෝහණධීර මහත්මිය පාර්ලිමේන්තුව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව පූර්ණ පැහැදිලි කිරීමක් සිදු කළාය. තවද මෙම අවස්ථාවේදී අදහස් දක්වමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්න මහතා, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකයේ උපත සිදුවූ ස්ථානයේ සිට (වර්තමාන ජනාධිපති ලේකම් කාර්යාලය) මෙම ශිෂ්‍ය පාර්ලිමේන්තුව පිහිටුවීමට ලැබීම ඓතිහාසික අවස්ථාවක් බව පෙන්වා දුන්නේය. එමෙ-න්ම සභාව ආමන්ත්‍රණය කළ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් හංස අබේරත්න මහතා, රටක පාලනය ස්ථාවර වීමට ජාතික ප්‍රතිපත්ති පැවතීමේ වැදගත්කම පෙන්වා දෙමින් පාසල් තුළද, තම පාසලේ සංවර්ධනය උදෙසා ස්ථිර ප්‍රතිපත්ති සකස්කර ගැනීමේ වැදගත්කම අවධාරණය කළේය.







# ඇගැයීම් උපයෝගී කර ගනිමින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පාර්ලිමේන්තුවේ කාර්යභාරය ශක්තිමත් කිරීම ඉතා වැදගත් - නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා



ඇගැයීම් උපයෝගී කර ගනිමින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පාර්ලිමේන්තුවේ කාර්යභාරය ශක්තිමත් කිරීම ඉතා වැදගත් බව නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා පසුගියදා පාර්ලිමේන්තුවේදි පැවසීය.

ඒ මහතා මේබව සඳහන් කළේ 2023 ජාතික ඇගයීම් සතිය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී පවත්වනු ලැබූ සැසිවාරය අමතමිනි. නියෝජ්‍ය කථානායකවරායගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සැසිවාරයට, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස, ඇගයීම් සඳහා වූ ගෝලීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදයේ සභාපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම්, සංසදයේ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයන්ත දිසානායක, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්න, ජාත්‍යන්තර සංවර්ධන ඇගයීම් සංගමයේ සභාපති ඒඩා ඔකම්පෝ "Ada Ocampo" ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික නියෝජිත අසුසා කුබොටා (Azusa Kubota) සහ ශ්‍රී ලංකා ඇගයීම් සංගමයේ සභාපති ආචාර්ය අසේල කළුගම්පිටිය යන මහත්ම මහත්මීන් එක්ව සිටියහ.

මෙහිදී අදහස් දැක්වූ නියෝජ්‍ය කථානායකවරයා සඳහන් කළේ Eval Colombo 2018 සන්දර්භය තුළ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී අත්සන් කරන ලද ඇගයීම් පිළිබඳ කොළඹ ප්‍රකාශය මෙරට පාර්ලිමේන්තුවේ ඇගයීම් ආයතනගත කිරීමේ ප්‍රධාන මාර්ගෝපදේශය බවට පත්ව ඇති බවයි. එමෙන්ම එම ප්‍රකාශයේ මූලධර්ම තුළ පිහිටමින් ඇගයීම් ආයතනගත කිරීම දැනටමත් ආරම්භ කොට ඇති බවද හෙතෙම සඳහන් කළේය.

ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය 2018 වසරේදී රජය විසින් අනුමත කරන ලද අතර, ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය අනුමත කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් විසින් ඉටු කරන ලද ආදර්ශමත් කාර්යභාරය වෙනුවෙන් සිය ප්‍රසාදය පළ කරන බවද රාජපක්ෂ මහතා සඳහන් කළේය.

සැසිවාරයට එක්වෙමින් අදහස් දැක්වූ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්න මහතා සඳහන් කළේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය අනුමත කරන ලද දකුණු ආසියාවේ පළමු සහ එකම රට ශ්‍රී ලංකාව බවයි.විශේෂයෙන් ජනාධිපතිවරයාගේ පරිපූර්ණ දැක්ම, නායකත්වය සහ මගපෙන්වීම ඔස්සේ ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම ප්‍රශංසනීය බවද නියෝජ්‍ය මහ ලේකම්වරයා ප්‍රකාශ කළේය.

# විවෘත පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ විශේෂ වැඩමුලුවක් අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන්



පාර්ලිමේන්තු ක්‍රියාදාමයට පුරවැසියන් සක්‍රීයව සම්බන්ධ කර ගැනීමේ විවෘත පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ විශේෂ වැඩමුලුවක් අග්‍රාමාත්‍ය ගරු දිනේශ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් මෙමස පැවැත්විණි.

විවෘත පාර්ලිමේන්තුවකට මූලාරම්භයක් සදහා වන පාර්ලිමේන්තු සංසදය, පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය (NDI) එක්ව සංවිධානය කළ මෙම වැඩමුළුව සඳහා අමාත්‍යාංශ ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම්වරු ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් එක්ව සිටියහ.

පාර්ලිමේන්තුව සහ රාජ්‍ය නිලධාරීන් සමග මෙරට ප්‍රතිපත්ති සම්පාදනය ඇතුළු ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට සම්බන්ධවීමේ අවස්ථාව මහජනතාවට ඉදිරියේදී තවදුරටත් පුළුල් වන බව පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා මෙහිදී පැවසීය. ආංශික අධීක්ෂණ කාරක සභා හරහා දේශපාලන අධිකාරිය සහ රාජ්‍ය නිලධාරීන් සමග විවිධ දේශපාලන අදහස් දරන තරුණ කොටස් ඇතුළු මහජනතාවට සම්බන්ධ වීමට අවස්ථාව හිමිවී ඇති බව ද ඒ මහතා පෙන්වා දුන්නේය.

දේශපාලන පක්ෂ පාට භේදයකින් තොරව මහජන නියෝජිතයන් ඇතලු මහජනතාව විවෘත පාර්ලිමේන්තුවකට මූලාරම්භයක් සදහා වන පාර්ලිමේන්තු සංසදය සමග සම්බන්ධ වෙමින් කටයුතු කිරීම සතුටට කාරණයක් බව ද ලැබූ විශාල ජයග්‍රහණයක් බවද මෙහිදී එම සංසදයේ සභාපති මයන්ත දිසානායක මහතා පැවසීය. සිවිල් සංවිධාන 13 ක් ඇතුළු පාර්ශ්වයන්ගේ සහයෝගීත්වයෙන් දිවයින පුරා ක්‍රියාත්මක කර ඇති මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවට මෙන්ම විවෘත පාර්ලිමේන්තු ක්‍රමවේදය සමග ජනතාව අත්වැල් බැදගනිමින් සිටින බවත් සභාපතිවරයා පැවසීය

මෙහිදී අදහස් දක්වමින් අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා පවසා සිටියේ ප්‍රජාතන්තවාදය ශක්තිමත් කරමින් සිදු කරන මෙවැනි ක්‍රියාවලින්ට සහය දෙමින් එම අභියෝග ජය ගැනීමේ විශාල වගකීමක් රාජ්‍ය නිලධාරීන් සතුවන බවයි. මෙහිදී අදහස් දැක්වූ පාර්ලිමේන්තුවේ වැඩබලන මහලේකම් චමින්ද කුලරත්න මහතා පෙන්වා දුන්නේ මහජනතාව ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමේ විවෘත පාර්ලිමේන්තු සංකල්පය වඩාත් ශක්තිමත් කිරීම සඳහා වත්මන් ආංශික අධීක්ෂණ කාරක සභා පිහිටුවීම ඉතා වැදගත් පියවරයක් බවයි. එසේම මෙහිදී පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් හංස අබේරත්න මහතා විසින් විවෘත පාර්ලිමේන්තු සංකල්පය තුළ මහජන ප්‍රවේශය වැඩි කිරීම පිළිබඳව අදහස් දක්වන ලදී.

# සෙයියඩ් අලි සාහිර් මෞලානා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දෙයි



ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වූ හිටපු රාජ්‍ය අමාත්‍යවරයෙකු වන සෙයියඩ් අලි සාහිර් මෞලානා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මෙමස කථානායකතුමා ඉදිරියේ දිවුරුම් දුන්නේය.

පරිසර අමාත්‍ය නසීර් අහමඩ් මහතා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට එම පක්ෂයේ උත්තරීතර මණ්ඩලය තීරණය කළේය.

එම තීරණයට එරෙහිව ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරන ලද පෙත්සම 2023 ඔක්තෝබර් 06 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීන්දුවෙන් නිෂ්ප්‍රභ කර ඇති බැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13)(අ) ව්‍යවස්ථාව අනුව, මෙම පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් 2023 ඔක්තෝබර් 06 දින සිට පවතින බව නිවේදනය කෙරිණි.

ඒ අනුව, නසීර් අහමඩ් මහතාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය අහෝසි වීමත් සමග එම මන්ත්‍රී ධුරය සඳහා අලි සාහීර් මෞලානා මහතා මෙලෙස පත්වී තිබේ.

1988 සිට ක්‍රියාකාරී දේශපාලනයේ නියුතු සේයෙඩ් අලි සාහිර් මෞලානා මහතා 1994 සිට 2004 දක්වා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළේය.

ඒ මහතා මීට පෙර 2015 - 2020 අටවැනි පාර්ලිමේන්තුවේ ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීම් රාජ්‍ය අමාත්‍ය, ජාතික ඒකාබද්ධතා සංහිඳියාව සහ රාජ්‍ය භාෂා නියෝජ්‍ය අමාත්‍ය සහ සමාජ සවිබල ගැන්වීම් රාජ්‍ය අමාත්‍ය යන අමාත්‍යධුර හොබවා තිබේ.





# වාර්ෂික සන්නද්ධ හමුදා අනුස්මරණ දිනයට සමගාමීව පොපි මල පැළඳවීම පාර්ලිමේන්තුවේදී



වාර්ෂික සන්නද්ධ හමුදා අනුස්මරණ දිනයට සමගාමීව පොපි මල පැළඳවීම පාර්ලිමේන්තුවේදී මෙමස සිදු කෙරිණි. ඒ අනුව ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සභාපති මේජර් ජෙනරාල් උපුල් පෙරේරා විසින් අග්‍රාමාත්‍ය ගරු දිනේශ් ගුණවර්ධන මහතාට පොපි මල පළඳවනු ලැබූ අතර අග්‍රාමාත්‍ය තුමන් විසින් ඒ සඳහා මුල්‍ය දායකත්වය දක්වන ලදී.

ඉන් අනතුරුව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතාට පොපි මල පැළඳවීම සිදු විය. ඉන් අනතුරුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට, පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මියට සහ වේත්‍රධාරී නරේන් ප්‍රනාන්දු මහතාට පොපි මල පැළඳවීම සිදු විය.

පළමුවන සහ දෙවන ලෝක සංග්‍රමයන්හිදි මෙන්ම පසුගිය තිස් වසරක පැවති අභ්‍යන්තර යුධ ගැටුම්වලදී දිවි අහිමි වූ සන්නද්ධ හමුදා සාමාජිකයන් අනුස්මරණය කරමින් ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය වාර්ෂිකව මෙම පොපි සැමරුම සංවිධානය කරනු ලබයි. මෙමගින් ලැබෙන ආදායම විශ්‍රාමික හමුදා සාමාජිකයන්ගේ සුභසාධන කටයුතු සඳහා වැය කරනු ලබයි.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ ගරු මහලේකම් ලුතිනන් කර්නල් අජිත් සියඹලාපිටිය, ගරු භාණ්ඩාගාරික මේජර් ශාන්තිලාල් කන්කානම්ගේ, සන්නද්ධ හමුදා අනුස්මරණ පොපි කමිටු සභාපති බ්‍රිගේඩියර් හේමන්ත ලියනගේ සහ කමිටු සාමාජිකයින් වන කපිතන් ටී.එම්. එච් මඩුගල්ල, කේ.එල්.එස් ජයවීර, ආර්.බී ජයතිස්ස යන මහත්වරුන්ද අයි. ඩී.ආර්.ඒ පද්මිනි මහත්මියද එක්විය.









# ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ කාර්යමණ්ඩලයට පුහුණු වැඩසටහනක් පාර්ලිමේන්තුවේදී



ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ කාර්යමණ්ඩලයට අයත් පර්යේෂණ නිලධාරින් සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මෙමස පැවැත්විණි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශය විසින් එම වැඩසටහන සංවිධානය කරන ලදි.

කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් මහජන නියෝජිතයින් වෙත කඩිනමින් තොරතුරු ලබා දීමේදි කාලීන සමාජ, ආර්ථික, මෙන්ම දේශපාලනික කරුණු පිළිබඳව මෙන්ම පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳවද පුළුල් අවබෝධයක් තිබීම වැදගත් වේ. උක්ත වැඩසටහන තුළදී පාර්ලිමේන්තුවේ සභාගර්භයේ කටයුතු සිදු වන ආකාරය, ස්ථාවර නියෝග, හැන්සාඩ් වාර්තා, පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය, පාර්ලිමේන්තුව පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයන් ආදිය පිළිබඳව පුළුල්ව සාකච්ඡාවට ලක් කිරීම සිදු විය.

මෙම වැඩසටහන සඳහා පාර්ලිමේන්තු සංචාරයක්ද අන්තර්ගත වූ අතර, එමඟින් පාර්ලිමේන්තුවේ සුවිශේෂි ස්ථාන හා ඒවායේ විශේෂතා පිළිබඳව විවෘත සංවාදයකද නිරතවීමට එම නිලධාරින්ට අවකාශය සැළසිණි.





පුවත්

# ශ්‍රී ලංකාවේ උත්තරීතරම ආයතනයේ පුහුණුවක් ලැබීමට අවස්ථාව ලැබීම විරල අවස්ථාවක්. උපරිම දැනුම ලබා ගන්න - පාර්ලිමේන්තු වැඩ බලන මහලේකම් චමින්ද කුලරත්න මහතා නවක සීමාවාසිකයින් හමුවේ පවසයි.




2023/2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය (NDI) සමඟ එක්ව පාර්ලිමේන්තුව තුළ, නවක සීමාවාසිකයින් සඳහා ලබා දෙන පුහුණුව සමාරම්භක අවස්ථාව මෙමස පැවත්විණි. ඒ පාර්ලිමේන්තු වැඩ බලන මහලේකම් චමින්ද කුලරත්න මහතාගේ ප්‍රධානත්වයෙණි.

නවක සීමාවාසිකයින් ලෙස දිවයින පුරා විශ්ව විද්‍යාල නියෝජනය කරමින් සිසුන් 48 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් මෙවර පුහුණුව සඳහා සුදුසුකම් ලබා ඇත. මෙහිදී නවක සීමාවාසිකයින් ආමන්ත්‍රණය කරමින් පාර්ලිමේන්තු වැඩ බලන මහලේකම් වරයා, ලක්ෂ ගණනක් වූ විශ්ව විද්‍යාල සිසුන් අතරින් ශ්‍රී ලංකාවේ උත්තරීතරම ආයතනයේ පුහුණු පාඨමාලාවක් හැදෑරීමට ලැබීම විරල අවස්ථාවක් බව පෙන්වා දුන්නේය. ඒ අනුව අද සිට ඉදිරි මාස 06ක කාලය තුළ පාර්ලිමේන්තුවේ ගත කරන සෑම කාල සීමාවකම ලබා ගත හැකි සියලුම දැනුම හා අත්දැකීම් ලබාගැනීමට කටයුතු කරන ලෙස, ඒ මහතා නවක සීමාවාසිකයින්ට උපදෙස් ලබා දුන්නේය. එමෙන්ම තමන්ගේ විශ්ව විද්‍යාලයේ ගෞරවය ආරක්ෂා කරමින් එහි කීර්තිය තව තවත් වර්ධනය කිරීමට මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නා ලෙසද වැඩි දුරටත් අදහස් දක්වමින් වැඩ බලන මහලේකම්වරයා පැවසීය.



මෙහිදී පාර්ලිමේන්තු ක්‍රියාවලිය හා ව්‍යුහය පිළිබඳව, වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු,පරිපාලන අධ්‍යක්ෂ ජී තච්චනරාණි, ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂ සහ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ එච්.ඊ. ජනකාන්ත සිල්වා, ආහාර සැපයීම සහ ගෘහ පාලන සේවා අංශයේ අධ්‍යක්ෂ ආර්.එච් එදිරිසිංහ, සම්බන්ධිකරණ ඉංජිනේරු එල්.ඩී.අධිකාරි, නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරක (ඉංග්‍රීසි) කෝකිලා සමරසේකර යන දෙපාර්තමේන්තු ප්‍රධාන මහත්ම මහත්මීන් විසින් සීමාවාසිකයින් දැනුවත් කරන ලදී. අනතුරුව නව සීමාවාසිකයින් පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවකට එක්වූ අතර එහිදී පාර්ලිමේන්තු සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශය මගින් අදාළ දැනුවත් කිරීම් සිදුකරන ලදී.

මේ අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයේ (NDI) නිලධාරීහු ඇතුලු පිරිසක් සහභාගී වූහ.



පුවත්

# තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම, ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවලට අතිශයින් අභියෝගාත්මකයි - කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා




වත්මන් ගෝලීය සන්දර්භය තුළ, තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම, විශේෂයෙන්ම ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවලට අතිශයින් අභියෝගාත්මක වී ඇති බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා පැවසීය. වත්මන් ලෝකය පෙර නොවූ විරූ ගෝලීය අභියෝගවලට මුහුණ දී සිටින අතරම, COVID-19 වසංගතය සහ එහි ප්‍රතිවිපාක, දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් සහ නැගී එන ගැටුම් මානව ප්‍රජාවට සහ පෘථිවියට බහුවිධ බලපෑම් නිර්මාණය කර ඇති බවත්, එම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇති බවත් කථානායකවරයා තවදුරටත් පෙන්වා දුන්නේය. එකී අභියෝග ජය ගැනීමට ශ්‍රී ලංකාව නොපසුබස්නා උත්සහයෙන් ක්‍රියා කරන බව ද කථානායකවරයා සඳහන් කළේය. කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ අදහස් පළ කළේ ඇන්ගෝලාවේ ලුආන්ඩාහි පැවැත්වෙන අන්තර් පාර්ලිමේන්තු සංගමයේ 147 වැනි සමුළුවට මේමස සහභාගී වෙමිනි.

පෙර නොවූ විරූ ගෝලීය අර්බුද මධ්‍යයේ මෑත කාලයේ ශ්‍රී ලංකාව සිය අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් පසුගිය වසරේදී අත්විඳින ලද බව සඳහන් කළ කථානායකවරයා පුලුල්ව පැතිරුනු සමාජ නොසන්සුන්තා සහ විරෝධතා හේතුවෙන් ඇති වූ අභියෝග ජයගැනීමේ ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ස්ථාවරව පවත්වා ගනිමින් රජය සහ ජනතාව සාමකාමී දේශපාලන පරිවර්තනයක් කරා ගමන් කරමින් සිටින බවද පැවසීය.

අන්තර් පාර්ලිමේන්තු සංගමයේ 147 වැනි සමුළුව ඔක්තොබර් 23 සිට 27 දක්වා ඇන්ගෝලාවේදී පැවැත්විණි. ඉදිරි වසර කිහිපය තුළ විශ්වයේ දිළිඳු බව තුරන් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් 193 එක්ව 2015 වසරේදී ගොඩනගන ලද තිරසාර සංවර්ධන අරමුණු 17 අතර 16 වැන්න වන "සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන සඳහා පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග" අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මෙවර සමුළුවේ තේමාව විය.

මෙම සමුළුව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු නලීන් බන්ඩාර ජයමහ, ගරු මොහොමඩ් මුසාම්මිල්, ගරු චින්තක අමල් මායාදුන්න, ගරු රාජිකා වික්‍රමසිංහ සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර යන මහත්ම මහත්මීහු සහභාගී වී සිටියහ.

පුවත්

# බත්තරමුල්ල එම්.ඩී.එච් ජයවර්ධන මහා විද්‍යාලයේ ප්‍රථම ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම වැඩබලන පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන්



බත්තරමුල්ල එම්.ඩී.එච් ජයවර්ධන මහා විද්‍යාලයේ ප්‍රථම ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම පාර්ලිමේන්තුවේ වැඩබලන මහලේකම් චමින්ද කුලරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් මෙමස එම විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

එම්.ඩී.එච් ජයවර්ධන මහා විද්‍යාලීය ඉතිහාසයේ ප්‍රථම වරට ශිෂ්‍ය පාර්ලිමේන්තුව රැස්කරමින් දරුවන්ගේ නායකත්ව කුසලතා වර්ධනය කිරීමට අවස්ථාව ලබා දීමට හැකිවීම සතුටක් බව එම විදුහලේ විදුහල්පතිනිය වන විජිතා ලක්ෂ්මි ලියනගේ මහත්මිය මෙහිදී අදහස් දක්වමින් පැවසුවාය.

මෙහිදී පාර්ලිමේන්තුවේ වැඩබලන මහලේකම් චමින්ද කුලරත්න මහතා විසින් 'පාර්ලිමේන්තුව සහ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය යන මැයින් ප්‍රධාන දේශනය ඉදිරිපත් කරන ලදී. ශිෂ්‍ය පාර්ලිමේන්තු සභිකයන්ට පාර්ලිමේන්තු ක්‍රියාවලිය සහ සම්ප්‍රදායන් පිළිබඳ දැනුම ප්‍රායෝගික අත්දැකීම් සහිතව වඩාත් සරළව මෙහිදී ඉදිරිපත් කෙරිණි.

අනතුරුව පැවති ශිෂ්‍ය පාර්ලිමේන්තු මංගල රැස්වීමේදී චාලිත කුමේශ් සිසුවා කථානායක ලෙස තේරී පත්වූ අතර අගමැති ප්‍රමුඛ ඇමතිවරුන්ගේ කෙටි අදහස් දැක්වීම්වලින් අනතුරුව රැස්වීම කල්තබන ලදී.

මෙහිදී පාර්ලිමේන්තුවේ වැඩබලන මහලේකම්වරයාගේ අතින් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අභිනව මන්ත්‍රීවරයන්ට නිල ලාංඡන පැළැඳවීම සහ සහතික පත් ප්‍රදානය ද සිදු කරන ලද අතර එම විදුහල් පුස්තකාලයට ග්‍රන්ථ ප්‍රදානය කිරීමක්ද සිදුවිය.

පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශය සංවිධානය කළ මෙම වැඩසටහන සඳහා පාර්ලිමේන්තුවේ මාධ්‍ය කළමනාකරු නිම්මි හාතියල්දෙනිය, ශ්‍රී ජයවර්ධනපුර කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ එච්. ඩබ්. එන්.කේ ඒකනායක යන මහත්මීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.







# 2022 විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව සහ 2024 සඳහා වූ ජාතික විගණන කාර්යාලයේ කාර්ය වැඩසටහන නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා වෙත පිළිගැන්වේ.



2022 වර්ෂයේ රජයේ විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව සහ ජාතික විගණන කාර්යාලයේ 2024 වර්ෂය සඳහා වූ වාර්ෂික කාර්ය වැඩසටහන විගණකාධිපති ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න මහතා විසින් පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතාට පිළිගැන්වීම පාර්ලිමේන්තු සංකීර්ණයේ නියෝජ්‍ය කථානායක කාර්යාලයේදී මෙමස සිදු විය.

විදෙස් ආධාර ව්‍යාපෘති, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සමාගම් ඇතුළු ආයතන 2200කට වැඩි සංඛ්‍යාවක් 2022 වර්ෂය තුළ විගණනයකර ඒවායේ විගණන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට විගණකාධිපතිවරයා විසින් කටයුතු කර තිබේ. එම කාර්යයන්වලට අදාළව සිදුකරන ලද කටයුතු මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කොට ඇත.

මීට අමතරව විශේෂ විගණන වාර්තා කිහිපයක්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට 2022 වර්ෂය තුළ විගණකාධිපතිවරයා විසින් කටයුතු කර ඇත. මෙම ආයතනවල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩි කිරීමට ගතයුතු ක්‍රියාමාර්ගවලට අදාළ නිගමන මෙම වාර්තාවට ඇතුළත්කර තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයා විසින් මෙම වාර්ෂික වාර්තාව නියෝජ්‍ය කථානායකවරයාට ඉදිරිපත් කර ඇත. ඊට අමතරව 2024 වර්ෂය සඳහා වූ ජාතික විගණන කාර්යාලයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ද නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතාට මෙහිදී බාරදෙන ලදී.


විගණකාධිපතිවරයාගේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා මෙහිදී කියා සිටියේය. එසේම 2024 වර්ෂය සඳහා වූ ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන සඳහා පාර්ලිමේන්තුවේ මුදල් කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර එය ඉන්පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවද නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා පැවසීය. තවද පාර්ලිමේන්තුවේ විවිධ කමිටු එක්ව විගණකාධිපතිවරයා සහ ජාතික විගණන කාර්යාලය සිදුකරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන්ද මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.

පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී හා නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්න, අධ්‍යක්ෂ-ව්‍යවස්ථාදායක සේවා එච්. ඊ. ජනකාන්ත සිල්වා, විගණකාධිපති ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න, නියෝජ්‍ය විගණකාධිපති නිමල් තිලකරත්න, විගණන අධිකාරී එන්. එන්.කේ. දිවාකර යන මහත්ම මහත්මීහු මෙම අවස්ථාවට සහභාගී වූහ.





# කාරක සභා පුවත්



කාරක සභා පුවත්

# ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් යෝජිත ව්‍යාවසායකත්ව සංවර්ධන විද්‍යායතනය, කුරුණෑගල, ටෙක්නො පාර්ක් (Techno Park) පරිශ්‍රයේ පිහිටුවීමට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) නාමල් රාජපක්ෂ මහතාගෙන් යෝජනාවක්.



ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් ස්ථාපිත කිරීමට යෝජනා කර තිබෙන ව්‍යාවසායකත්ව සංවර්ධන විද්‍යායතනය පිහිටුවීමට කුරුණෑගල ඉදිකර තිබෙන ටෙක්නො පාර්ක් (Techno Park) භූමිය හා ගොඩනැගිල්ල සුදුසුදැයි සොයා බලන ලෙසත්, ඒ පිළිබඳව ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ අවධානයට යොමු කරන ලෙසත් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) නාමල් රාජපක්ෂ මහතා පැවසීය.

ඒ ව්‍යාවසායකත්ව සංවර්ධන විද්‍යායතනය පිහිටුවීමට සුදුසු ස්ථානයක් ලබා දෙන ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් කෙටි,මධ්‍යම හා දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනු කාරක සභාවෙන් කල ඉල්ලීමට පිළිතුරු ලබා  දෙමිනි.

මේ පිළිබඳ කරුණු සාකච්ඡා වුයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) නාමල් රාජපක්ෂ මහතගේ සභාපතිත්වයෙන් කෙටි,මධ්‍යම හා දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනුකාරක සභාව මෙමස පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලනාධිකාරිය මගින් පෙන්වා දුන්නේ ලංකවේ ආර්ථිකයට 50% කට වඩා දායකත්වය ලබා දෙන්නේ කුඩා ව්‍යාපාර බවයි. ව්‍යාවසායකත්ව අධ්‍යාපනයක් නොමැති කමින් ලංකාවේ ආරම්භ කරන ව්‍යාපාරවලින් 85% ආරම්භයේදීම වැසී යනබව පර්යේෂණ වලින් අනාවරණය වී තිබෙන බවද විශ්ව විද්‍යාල නිලධාරීහු මෙහිදී ප්‍රකාශ කළහ. ඒ අනුව ව්‍යාවසායකත්ව සංවර්ධන විද්‍යායතනයක් පිහිටුවීම ඔස්සේ මෙරට පුද්ගලයින්ට ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් විධිමත් අධ්‍යාපනයක් ලබා තමන්ගේ ව්‍යාපාර වැඩි දියුණු කර, රටේ ආර්ථිකයට දායක වීමට හැකියාව ලැබෙන බව එම නිලධාරීහු පැවසූහ.

මෙහිදී සභාපතිවරයා මෙම ව්‍යාවසායකත්ව විද්‍යායතනයට බඳවා ගන්නා ආකාරය ප්‍රශ්න කළේය. ඒ අනුව උසස්පෙළ විභාගය සමත්වීම හෝ ' ලකුණු මත පදනම්ව මේ සඳහා සිසුන් ඇතුලත් කර නොගතයුතු බවයි කමිටුවේ මතය වුයේ. ව්‍යාවසායකත්ව සංවර්ධනය ගැන ලොව පුරා විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක වන ආයතන ගැන අධ්‍යනය කර ඒවායෙන් ලබාගත හැකි දේවල් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසද සභාපතිවරයා බලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.







කාරක සභා පුවත්

# දරුවන් සිඟමනට යොදා ගැනීම නතර කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමට විශේෂ කමිටුවක්



මෙරට දරුවන් සිඟමනට යොදා ගැනීම නතර කිරීම සදහා සුදුසු යාන්ත්‍රණයක් නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් කටයුතු පිළිබද අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී තීරණය විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, කාන්තා හා ළමා පොලිස් ඒකකය ඇතුළු පාර්ශ්වකරුවන්ගෙන් සැදුම්ලත් මෙම විශේෂ කමිටුව සම්බන්ධීකරණය කිරීමේ කාර්යය ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැවරිණි.

රාජ්‍ය අමාත්‍ය ගරු ගීතා කුමාරසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙමස පාර්ලිමේන්තුවේ පැවති කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍ය උපදේශක කාරක සභාවේදී මෙම තීරණය ගනු ලැබිණි.

මේ වන විට දරුවන් සිගමනට යොදා ගැනිම ව්‍යාපාරයක් බවට පත්වීම සම්බන්ධව මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරුණු අතර, සිඟමන් යැදිම සඳහා දරුවන් යොදා ගැනීම සම්පූර්ණයෙන්ම නතර කළ යුතු බව රාජ්‍ය අමාත්‍ය ගරු අනුප පැස්කුවල් මහතා අවධාරණය කළේය.

පසුගිය සැප්තැම්බර් 5 වැනිදා සිට 8 වැනිදා දක්වා මහ නගර සභා 24 ක් සහ නගර සභා 41ක් ආවරණය වන පරිදි නගර ආශ්‍රිතව යාචකයින් පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ බව ජාතික සමාජ සංවර්ධන ආයතනය පෙන්වා දුන්නේය. මෙම සමීක්ෂණයේ දත්ත සටහන් කරමින් පවතින අතර මේ වන විට වාර්තා වී ඇති දත්තවලට අනුව යාචකයින් 3000 ත් 4000 ත් අතර සංඛ්‍යාවක් අදාළ ප්‍රදේශවල සිටින බව නිලධාරීහු පෙන්වා දුන්හ. එම දත්ත සටහන් සම්පූර්ණ කළ පසු සිඟමන් සඳහා භාවිතා කරන වයස අවුරුදු දහඅටට අඩු ළමුන් පිළිබඳ තොරතුරු ලබාදිය හැකි බව ඔවුහු පැවසූහ.

උක්ත සමීක්ෂණයේ වාර්තාව පිහිටුවනු ලබන විශේෂ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස ද මෙහිදී අමාත්‍යවරිය විසින් අදාළ නිලධාරින් වෙත උපදෙස් ලබා දුන්නාය. එසේම, මුළු රටම ආවරණය වන පරිදි සමීක්ෂණයක් පැවැත්වීමේ අවශ්‍යතාව මෙහිදී රාජ්‍ය අමාත්‍යවරිය අවධාරණය කළහ.







කාරක සභා පුවත්

# තිරිඟු පිටි ගැටලුව සම්බන්දයෙන් වෝහාරික විගණනයක් පවත්වන්න - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවට උපදෙස්



ලංකාවේ ගබඩා වල දැනට පවතින තිරිඟු පිටි ප්‍රමාණයන් පිළිබඳවද ගණනය කර, තිරිඟු පිටි ගැටලුව සම්බන්දයෙන් මාස 2ක් තුල වාර්තාවක් ලබා දෙන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විගණකාධිපති දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දුන්නේය. මිල සූත්‍රයක් තිරිඟු පිටි සඳහාද පවතීනම් එක් එක් පාර්ශව වල අභිමතය පරිදි මිල ගණන් තීරණය කිරීමට අවස්ථාව නොලැබෙන බවද මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේය.

මේ පිළිබඳ කරුණු සාකච්ජා වුයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව මෙමස පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.



මේ වන විට ලංකාව පුරා වෙළඳසැල් වල විවිධ මිල ගණන් යටතේ තිරිඟු පිටි අළෙවි කිරීම සිදුවන බව කමිටු සාමාජික මන්ත්‍රීවරු පෙන්වා දුන්හ. කෙසේ වෙතත් මුදල් ආමාත්‍යාංශය ලබා දුන් මිළ ගණන් අනුව තිරිඟු පිටි කිලෝවක් රුපියල් 198ක මුදලකට අළෙවි කළ හැකි බවද කමිටුව නිලධාරීන්ට පෙන්වා දෙන ලදී. තිරිඟු පිටි මිල සැකසීමේදී මිල ගණනය කිරීම් දෙකක් ක්‍රියාත්මක වන බවත් මෙම තත්ත්වය වෙනස් කලයුතු බවත් සභාපතිවරයා අවධාරණය කළේය.

තිරිඟු පිටි සඳහා පැනවූ බදු ගාස්තු වැඩිවීම හේතුවෙන් මිල ඉහළ යාම සිදු වුවත්, එම වැඩි වූ බදු මුදල ඒ වනවිටත් මෙරට ගබඩා වල පැවති තිරිඟු පිටි සඳහාද එකතුකර මිල ඉහළ දමා ඇති බව සභාපතිවරයා නිලධාරීන් හමුවේ පැවසුවේය.

පසුගිය සමයේ ගෑස් හා කිරිපිටි සඳහා මිල සූත්‍රයක් සැකසීම වෙනුවෙන් දැරූ වෙහෙස සිහිපත් කල සභාපතිවරයා තිරිඟු පිටි මිල නියාමනයටද මිල සූත්‍රයක දැඩි අවශ්‍යතාවය පෙන්වා දුන්නේය. වඩාත් විනිවිධභාවයකින් කටයුතු කිරීමටනම් මිල සූත්‍රයක් වහාම සකස් කළයුතු බවට කමිටුව අවධාරණය කරන ලදී.





කාරක සභා පුවත්

# ප්‍රමුඛතාව මත මහා මාර්ග නඩත්තු කටයුතු සහ නැවතී ඇති මාර්ග ව්‍යාපෘති නැවත ආරම්භ කරනවා - අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පවසයි





මේ වන විට අතරමග නැවතී ඇති මාර්ග ව්‍යාපෘති මෙන්ම මහා මාර්ග නඩත්තු කටයුතු ලැබෙන මුදල් ප්‍රතිපාදන අනුව ප්‍රමුඛතාව මත නැවත කඩිනමින් ආරම්භ කරන බව ප්‍රවාහන,මහාමාර්ග සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා  පැවසීය.

මේ අනුව අදාළ ආසනවල මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම්ද සලකා බලමින් මාර්ග සංවර්ධන අධිකාරිය සමග ප්‍රමුඛතාව ලබා දිය යුතු මාර්ග පිළිබඳ නැවත සමාලෝචනයක යෙදීම සඳහා සියලු අදාළ පාර්ශ්ව අමාත්‍යාංශයට කැඳවීමට පියවර ගන්නා ලෙසද අමාත්‍යවරයා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මහතා මේ බව පවසා සිටියේ මේ මස පාර්ලිමේන්තුවේදී පැවති ප්‍රවාහන සහ මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට එක්වෙමිනි.

රටේ පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් දේශීය ණය අරමුදල් මත ආරම්භ කෙරුණු කිලෝමීටර් ලක්ෂයේ මාර්ග සංවර්ධන වැඩසටහන, ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත ආරම්භ වී ඇති I-Road වැඩසටහන ඇතුළු ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිපාදන ලබා දීම ණය ප්‍රතිව්‍යුහගතකරණය සිදු කරන තෙක් එම ආයතන විසින් සම්පූර්ණයෙන්ම නතර කර ඇති බව අමාත්‍යවරයා පැවසීය. එබැවින් කෙසේ හෝ නැවතී ඇති මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට එම ණය ආධාර සපයන ආයතන සමග සාකච්ඡා කරමින් අදාළ පියවර ගන්නා බව අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.





කාරක සභා පුවත්

# දේශීය පයිනස් දැව නිෂ්පාදනය සඳහා වන පිරිවැය අඩුකර ගැනීමට පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන්ට උපදෙස්.

## ■ආනයනික පයිනස් දැව සඳහා බදු වැඩි කිරීමට කාරක සභාවෙන් යෝජනා.



ශ්‍රී ලංකාව තුළ දැව බවට පත් කිරීම සඳහා සුදුසු පයිනස් වන වගාවන් පවතින බැවින් තවදුරටත් දේශීය පයිනස් දැව නිෂ්පාදනය සඳහා වන පිරිවැය අඩුකර ගැනීමට පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

මේ පිළිබඳ කරුණු සාකච්ඡා වුයේ රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් ඉදිරිපත්කළ ආනයනික පයිනස් දැව සඳහා වන පිරිවැය සහ දේශීය පයිනස් දැව නිෂ්පාදනය සඳහා වන පිරිවැය පිළිබඳ විශ්ලේෂණ වාර්තාව සළකා බැලීමට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් මාන්නප්පෙරුම මහතාගේ සභාපතිත්වයෙන් පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව ස මෑමස පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.



ඒ අනුව ශ්‍රී ලංකාව තුළ දැව බවට පත් කිරීම සඳහා සුදුසු පයිනස් වන වගා හෙක්ටයාර් 2964 ක් ඇති බවත්, ඉන් ඝන මීටර් 750,000 දැව බවට පත් කිරීමට හැකි බව කමිටුව හමුවේ කරුණු දක්වමින් නිලධාරීහු පැවසූහ. එසේ වුවත් වසරකට රු. කෝටි 160ක පමණ පයිනස් දැව,ඝන මීටර් 15,462ක් ආනයනය කරන බව කමිටුවේදී අනාවරණය විය. මේ වන විටත් රු.කෝටි 922ක් වටිනා ඝන මීටර් 375,000 ක ඉරූ පයිනස් දැව සංචිත පැවතියද තවදුරටත් පයිනස් දැව ආනයනය කිරීම ගැටලුවක් බව කමිටුව අවධාරණය කළේය. මෙහිදී අනාවරණය වූයේ දේශීය පයිනස් ඉරූ දැව ඝන මීටරයක් (ඝන මීටර් 2ක් කුට්ටි දැව) සඳහා වන නිෂ්පාදන පිරිවැය ඝන මීටරයට රු. 115,000 පමණ වන අතර ෆයිනස් ඉරූ දැව ඝන මීටරයක් ආනයනය කිරීම සඳහා රු. 93,500 ක් පමණ වැය වන බවයි. ලංකාව මුහුණු දී ඇති විදේශ විනිමය ගැටලුව මධ්‍යයේ විශාල මුදලක් වැය කර මෙලෙස ලංකාවට ෆයිනස් දැව ආනයනය කිරීම ගැටලුවක් වී තිබීම ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානයට යොමු විය.

ඒ අනුව කමිටුව විසින් දැව සංස්ථාවේ නිලධාරීන් ලබා දුන් විශ්ලේෂණ වාර්තාව සලකා බලා පයිනස් සඳහා වන නිෂ්පාදන පිරිවැය තවදුරටත් අඩු කරගැනීට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව වසරකට ඝන මීටර් 75,000 පමණ වන පයිනස් ගස් කපා,ඒවා දේශීයව ප්‍රයෝජනයට ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදී. එලෙස කටයුතු කළහොත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්ෂිකව රුපියල් මිලියන 441ක් ලැබෙන බවත්, ඒ ආශ්‍රිත රැකියා සිදුකරන කම්කරුවන්ට රුපියල් මිලියන 503ක්, ප්‍රවාහන කටයුතුවල නිරතවන්නන්ට රුපියල් මිලියන 433ක් හා දැව ඉරන්නන්ට රුපියල් මිලියන 1.2ක් ලැබෙන බව කමිටුව අවධාරණය කළේය. එමෙන්ම දැව සංස්ථාවේ ආදායම ලෙස රු. මිලියන 331ක් දක්වා වර්ධනය කරගත හැකි බව පෙන්වා දුන් කමිටුව දේශීය වශයෙන් මෙරට ජනතාවට සහ රජයට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව කරුණු ඉදිරිපත් කළේය.

# අංක 2340/45 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කළ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය යටතේ නියමය අහෝසි කිරීමට මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය.



2023 මැයි 17 දින අංක 2332/14 දරන ගැසට් නිවේදනය මගින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩ බිරිගු ආනයනය කිරීමේදී කිලෝග්‍රෑමයක් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 75 සිට රු. 25 දක්වා අඩු කර තිබුණි. මෙම අඩු කිරීම 2023 මැයි මස 18 දින සිට වසරක් වලංගු බව සඳහන් කොට තිබූ අතර මෙම නව ගැසට් නිවේදනය මගින් එම කාලසීමාව අවලංගු කිරීම සිදු කර ඇති අතර එම නිසා නැවත බඩ ඉරිගු ආනයනය කිරීමේදී කිලෝග්‍රෑමයක් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 75 දක්වා වැඩි වීම සිදු වේ.

2023 ජූලි 13 දින අංක 2340/45 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කළ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය යටතේ නියමය අහෝසි කිරීමට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය හිමිවිය.

මේ සඳහා අනුමතිය හිමි වුයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව මෙමස පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

මෙහිදී මෙම නියමය අහෝසි කිරීමට කාරක සභාවේ අනුමතිය හිමි වුවද බඩඉරිගු ආනයනය සහ ත්‍රිපෝෂ නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සකස් කරන ලෙස අදාළ නිලධාරීන්ට කමිටුව විසින් උපදෙස් ලබාදීම සිදු කරන ලදි. එසේම වසර ගණනාවක් තිස්සේ නිෂ්පාදන ඉලක්කයට වඩා අඩු නිෂ්පාදනයක් පවතින බව කමිටුවට නිරීක්ෂණය වන බවද මෙහිදී පෙන්වා දුන්නේය. තවද ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ත්‍රිපෝෂ ප්‍රමාණයක් සකස් කිරීමට අවශ්‍ය වෙනස්කම් යෝජනා කිරීම සඳහා දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට අවශ්‍ය වන සියලුම පාර්ශ්ව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට කැඳවන බවද මෙහිදී කාරක සභාවේ සභාපතිවරයා සඳහන් කළේය.

මේ අනුව කමිටුව විසින් මේ පිළිබඳ දීර්ඝ වශයෙන් පරීක්ෂා කර බැලීම සිදු වූ අතර කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා සඳහන් කළේ එක් ගැසට් පත්‍රයක අඩංගු කරුණු පාර්ලිමේතුවේ අනුමතියට ඉදිරිපත් කොට තිබියදී තවත් ගැසට් නිවේදනයක් මගින් පූර්ව ගැසට් නිවේදනයේ කරුණු අවලංගු කිරීමට කටයුතු කිරීම ගැටලු සහගත බවයි.

මේ නිසා මේ පිළිබඳ පැමිණි නිලධාරීන්ගෙන් විමසා සිටි අතර මෙය ප්‍රතිපත්තිමය කරුණු මත සිදු වන බව ඔවුහු පෙන්වා දුන්හ.







කාරක සභා පුවත්

# දුම්වැටි හා මත්පැන් වලින් ආණ්ඩුව උපයන මුදලමෙන් තුන් ගුණයක් මත් උවදුරට ගොදුරුවූ පුද්ගලයින්ට ප්‍රතිකාර වෙනුවෙන් වැය කරනවා - සෞඛ්‍යය විශේෂඥයින් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී හෙළිකරයි.

**මන්ත්‍රීවරු 225 දෙනාගේම අත්සනින් මත් උවදුර තුරන් කරන්න, පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරන්න - විපක්ෂ නායක වරයාගෙන් යෝජනාවක්.**



දුම්වැටි හා මත්පැන් වලින් ආණ්ඩුව උපයන මුදල මෙන් තුන් ගුණයක් මත් උවදුරට ගොදුරුවූ පුද්ගලයින්ට ප්‍රතිකාර වෙනුවෙන් වැය කරන බව සෞඛ්‍යය විශේෂඥයින් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව හමුවේදී පැවසුහ.

මේ පිළිබඳ කරුණු අනාවරණය වුයේ රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව එහි සභාපති මහජන ආරක්ෂක අමාත්‍ය ගරු ටිරාන් අලස් මහතාගේ ප්‍රධානත්වයෙන් මෑතක පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

රට තුළ ශීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා යෝජනා හා අදහස් ලබාගැනීමේ අරමුණින් මේ සාකච්ඡාව සඳහා මත් උවදුර පිටු දැකීම වෙනුවෙන් කටයුතු කරන ආයතන හා නිලධාරීන් කැඳවා තිබිණි.

කමිටුව හමුවේ අදහස් දක්වමින් නිලධාරීන් පෙන්වා දෙනු ලැබුවේ, 1997 වර්ෂයේ සිට මේ දක්වා ආණ්ඩු හා විවිධ පාර්ශ්ව මත් උවදුර පාලනය හා තුරන් කිරීම සඳහා ඉදිරිපත්කර තිබූ විවිධ යෝජනා හා අදහස් ඇතුලත් වාර්තා රැසක් ප්‍රකාශයට පත් කර ඇති බවයි.

ඒ සියලු අදහස් හා යෝජනා වර්තමානයට ද ගැලපෙන හෙයින් අවශ්‍ය වන්නේ ඉදිරිපත් කරන අදහස් හා යෝජනා ප්‍රයෝගික මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම නිලධාරීහු පෙන්වා දුන්හ.

මෙරට දුම්වැටි භාවිතය සමාජය තුලින්ම මතුවූ විරෝධතා හේතුවෙන් සීග්‍ර ලෙස අඩු කරගැනීමට හැකියාව ලැබුන බව පෙන්වා දුන් සෞඛ්‍යය විශේෂඥයින් මත් උවදුර පාලනයද සමාජය තුලින්ම මතු වීමේ වැදගත්කම මෙහිදී පැහැදිලි කළහ.

නීති විරෝධී මත්ද්‍රව්‍ය යම් පොලිස් බල ප්‍රදේශයක වර්ධනය වන්නේනම් එම ප්‍රදේශය භාර පොලිස් නිලධාරියා ඒ සඳහා වග කියන ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත් අදාළ පොලිස් නිලධාරියාගේ වැටුප් වර්ධක හා උසස්වීම සඳහා මෙම මත් උවදුර පාලනයට එම නිලධාරියා ගන්නා ක්‍රියා මාර්ග මොනවාදැයි සළකා බැලීමේ අවශ්‍යතාවය ගැනද කමිටුව හමුවේ කරුණු ඉදිරිපත් විය.

මෙහිදී අදහස් දක්වමින් විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා මන්ත්‍රීවරු 225 දෙනාගේම අත්සනින් මත් උවදුර තුරන් කිරීම සඳහා පාර්ලිමේන්තුව හරහා යෝජනාවක් සම්මත කරගැනීමේ වැදගත්කම පෙන්වා දුන්නේය. ඒ ඔස්සේ ලබා දිය හැකි පණිවුඩයේ ප්‍රභලත්වය ගැනද කමිටුවේදී දීර්ඝ ලෙස සාකච්ජා විය.





# විදේශ ආයෝජනයන්ට, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනට බාධා වන ගැටලු හා නව ආයෝජන අවස්ථා හඳුනාගන්න අදාළ සියලු පාර්ශව සමග සම්බන්ධීකරණයෙන් යාන්ත්‍රණයක් හදන්න - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) නාමල් රාජපක්ෂ මහතාගෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයට උපදෙස්.



විදේශ ආයෝජනයන්ට හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට බාධා වන ගැටලු හා නව ආයෝජන අවස්ථා හඳුනාගැනීමට අදාළ සියලු පාර්ශව සමග සම්බන්ධිකරණයෙන් විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීමට මුලිකත්වය ගන්නා මෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) නාමල් රාජපක්ෂ මහතා විදේශ කටයුතු අමාත්‍යාංශයට උපදෙස් ලබා දුන්නේය.

විදේශ කටයු අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) ඇතුළු අදාළ සියලුම ආයතන වලින් සමන්විතව මෙම විධිමත් යාන්ත්‍රණය සකස් කරන ලෙස මන්ත්‍රීවරයා වැඩි දුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කළේය.

මේ පිළිබඳ කරුණු සාකච්ඡා වුයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

විදේශ තානාපති කාර්යාල වල කටයුතු කරගෙන යාමේදී මතුවන ගැටලු විසඳීමට අවශ්‍ය සහය ලබාගැනීම සඳහා මෙම ආයතන ඒකාබද්ධව ගොඩ නගන ක්‍රියාකාරී කමිටුවට හැකියාව ලැබෙන බව සභාපතිවරයා අවධාරණය කළේය. එමෙන්ම ආයෝජකයන් මෙරට ආයෝජනයට දක්වන කැමැත්ත හා එසේ ආයෝජනය කිරීම් ප්‍රතික්ෂේප කර ඇත්නම් ඒවාට හේතු මොනවාද යන්න කරුණු දක්වමින් විදේශ ආයෝජනවල ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් සකස් කර කාරක සභාවට ලබා දෙන ලෙසද කාරක සභාව විසින් නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදි.

මේ අතර වාණිජ දෙපාර්තමේන්තුවේ වර්තමානයේ සිදුවන කාර්යයන් පිළිබඳවද කාරක සභාවේදී සාකච්ඡා විය. එහිදී අදාළ නිලධාරීන් ප්‍රකාශ කළේ මානව සම්පතේ පවතින අඩුපාඩු හේතුවෙන් තම කටයුතු සිදු කිරීමේදී ගැටලු මතුව ඇති බවයි. ඒ අනුව එම දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කරගෙන යාම සඳහා සීමාවාසිකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලෙසට සභාපතිවරයා උපදෙස් ලබාදුන්නේය.







කාරක සභා පුවත්

# වසර ගණනාවක් තිස්සේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පවතින සේවක පුරප්පාඩු පිරවීමේ ගැටලුව විසඳීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මැදිහත් වෙයි.

## ශ්‍රී ලංකාව වටා මුහුදු ප්‍රදේශයතුල මුහුදු පුරා වස්තු 114ක්




වසර ගණනාවක් තිස්සෙ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පවතින සේවක පුරප්පාඩු පිරවීමේ ගැටලුව විසඳීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මැදිහත් වන බව රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා ප්‍රකාශ කළේය.

අදාළ පුරප්පාඩු සම්පූර්ණ නොකිරීමෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතු සාර්ථක කර ගැනීමට අපහසු වී ඇති බව රාජ්‍ය අමාත්‍යවරයා අවධාරණය කළේය.

මේ පිළිබඳ කරුණු සාකච්ඡා කෙරුණේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතාගේ සභාපතිත්වයෙන් මෑතක පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

2023 වසරේ මැයි 24 වන දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට දෙන ලද නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා වර්තමාන කාර්ය සාධනය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් පිරිසක් මෙදින කාරක සභාව හමුවට කැඳවා තිබුණි.

කාරක සභාව හමුවේ කරුණු දක්වමින් නිලධාරීන් ප්‍රකාශ කළේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කර, ක්‍රියාත්මක කරමින් පවතින කාර්යයන් ඉදිරියට ගෙන යාමටනම් එම දෙපාර්තමේන්තුවේ ඉහළ තනතුරු සඳහා දැනට පවතින පුරප්පාඩු 27 සම්පූර්ණ කළ යුතු බවයි. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව, ඇතුළු අදාළ සියලු පාර්ශ්ව සමග සාකච්ඡා කර මෙම ගැටලුව වහාම විසඳීමට මැදිහත් වන බව කාරක සභා සභාපතිවරයා ප්‍රකාශ කළේය.

ලෝක උරුමයන් ලෙස නම් කිරීමට යුනෙස්කෝ ආයතනයට යෝජනා කිරීම සඳහා මේ වන විට ස්ථාන 10ක් හඳුනාගෙන ඇති බව පුරාවිද්‍යා නිලධාරීහු කාරක සභාවට දැන්වූහ. ඒ අනුව එම ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳව කාරක සභාවට වාර්තාවක් ලබා දෙන ලෙසට සභාපතිවරයා උපදෙස් ලබා දුන්නේය.

මේ අතර ශ්‍රී ලංකාව වටා මුහුදු ප්‍රදේශයතුල පවතින මුහුදු පුරා වස්තු 114ක් හඳුනාගෙන ඒවායේ සියලු තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් පවත්වාගෙන යන බව නිලධාරීහු කමිටුව ඉදිරියේ කරුණු ඉදිරිපත් කළහ. ගොඩබිම තුළ ස්මාරක ලෙස පමණක් පවතින පුරා වස්තු ගැසට් මගින් ප්‍රකාශයට පත්කළ හැකි වුවත් මුහුදු පුරාවස්තු ගැසට් කිරීම සම්බන්ධයෙන් ගැටලුවක් පවතින බව නිලධාරීන් ප්‍රකාශ කළ අතර, කාරක සභාව උපදෙස් ලබාදුන්නේ අදාළ ගැටලුව සම්බන්ධයෙන් පනත විමර්ශනය කර ගැසට් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසයි.





# ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරිපාලන දුර්වලතා රැසක්! - අකුමිකතා පිළිබඳවත් කෝප් කමිටුව විමර්ශනය කරයි

**ජ්‍යෂ්ඨ කළමනාකරණ තනතුරු 16ක් වැඩබලන තනතුරු බව හෙළි වෙයි - වඩාත් විවෘත සහ විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් තුළ ස්ථිර පත්කිරීම් කඩිනම් කිරීමට නිර්දේශ**




පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් මේ මස රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කෝප් කමිටුව) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කැඳවා තිබිණි.

මෙහිදී 2019 සහ 2020 වර්ෂ සඳහා වූ විගණකාධිපති වාර්තා සහ වත්මන් කාර්යසාධනය පිළිබඳව විමර්ශනය කිරීම සිදුවිය. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් W.S සත්‍යානන්ද, නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රජීව් සූරියආරච්චි, සාමාන්‍යාධිකාරි (වැඩබලන) K.A ජානක යන මහත්වරු ඇතුළු නිලධාරීහු පිරිසක් මෙම අවස්ථාවට කැදවා තිබිණි. මෙහිදී පහත සදහන් කරුණු කෙරෙහි විශේෂ අනධානය යොමු විය.

### ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරු 16ක්ම වැඩබලන තනතුරු ලෙස පැවතීම

අධිකාරියේ සාමාන්‍යධිකාරී තනතුර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 16ක් වැඩබලන තනතුරු බව අනාවරණය විය. මෙහිදී ලේකම්වරයා පවසා සිටියේ මෙම අධිකාරිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය යටතේ විධිමත් ක්‍රමවේදයෙන් බැහැරව බඳවා ගැනීම් සිදු කර ඇති බැවින් එය නිවැරදි මාවතට ගැනීම සඳහා මේ වන විට පියවර ගනිමින් සිටින බවයි. තවද උප සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් අභ්‍යන්තර කමිටුවක්ද පත්කොට මෙම තනතුරු ස්ථිර කිරීම සදහා නැවත සමාලෝචනය කරමින පවතින බවත් අධිකාරියේ සභාපතිවරයා පැවසීය.

මෙම ආයතනය රුපියල් බිලියන ගණනක් හුවමාරු වන ආයතනයක් බැවින් අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) තනතුර පවා වැඩබලන තනතුරක් වීම විශාල ගැටළුවක් බැවින් මේ තත්ත්වය ඉක්මනින්ම නිවැරදි කරන ලෙස ද විගණකාධිපතිවරයා දන්වා සිටියේය.

මෙහිදී අධිකාරියේ සභාපතිවරයා පවසා සිටියේ වැඩබලන තනතුරු 16න් සුදුසුකම් ඇත්තේ 5කට ආසන්න පිරිසකට බවයි. මේ අනුව අභ්‍යන්තරිකව සුදුසුකම් සහිත පුද්ගලයන් මෙම තනතුරුවලට පත් කිරීමට කටයුතු කරන ලෙසද බාහිරින් ද සුදුසුකම් සහිත පුද්ගලයන් බඳවා බඳවාගැනීමට කටයුතු කරන ලෙස ද නියෝග කෙරිණි.

ආයතනයේ සමුච්චිත අලාභය රුපියල් බිලියන විස්සකට ආසන්න බව මෙහිදී අනාවරණය විය. එසේම පසුගිය වසර පහක කාලය තුළ පමණක් රුපියල් බිලියන 5 ක අලාභයක් ලබා ඇති බව සභාපතිවරයා පෙන්වා දුන්නේය. තවද රුපියල් බිලියන 10 ක පමණ මුදලක් ණය ලාභීන්ගෙන් එකතු කර ගැනීමට නියමිතව ඇති බවත් හෙළිවිය.

අධිකාරිය 2019 වසරේ සිට වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොතිබීම ගැන දැඩි අප්‍රසාදය පළ විය. මේ අනුව 2019, 2020, 2021 යන වසරවල වාර්ෂික වාර්තා 2023 නොවැම්බර් 17 දිනට පෙර ද 2022 වාර්ෂික වාර්තාව දෙසැම්බර් 31 ට පෙර ද පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස නියෝග කෙරිණි.



කාරක සභා පුවත්

# කොළඹ නගරය විටින් විට ජලයෙන් යට වී ජලය පිටාර ගැලීමේ ගැටලුව පිළිබඳ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ අවධානය



කොළඹ නගරය විටින් විට ජලයෙන් යට වී ජලය පිටාර ගැලීමේ ගැටළුව පිළිබඳ පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේදී අවධානය යොමු විය. එහිදී අනාවරණය වූ කරුණක් වූයේ කොළඹ නගර සභාව සහ ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව අතර විධිමත් ආකාරයේ සම්බන්ධීකරණයක් නොමැති බවයි. පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මහතාගේ ප්‍රධානත්වයෙන් මෑතදී පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදී මේ පිළිබඳ සාකච්ඡා කෙරිණි.

කොළඹ නගරය තුළ මුල් අවස්ථාවේ හඳුනාගත් මූලික ව්‍යාපෘති 15, මේ වන විට 20 දක්වා වැඩි වී ඇති නමුත්, ඉන් 2015-2019 කාලය තුළ මහා නගර අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 6 ක් හැරෙන්නට පසුගිය වසර තුනක කාලය තුළ, වෙනත් කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කොළඹ මහනගර සභාවට නොහැකි වී ඇති බවද මෙහිදී අනාවරණය විය. එබැවින් පිටාර ජලය ඇතිවීම වැළැක්වීම සඳහා, අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කරන ලෙස කාරක සභා සභාපතිවරයා විසින් කොළඹ මහ නගර සභා නිලධාරීන්ට නිර්දේශ කළ අතර, ඒ සම්බන්ධව විටින් විට විමර්ශනයක් සිදු කිරීමට ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව බලාපොරොත්තු වන බව ද, දැන්ම් දුන්නේය.

එමෙන්ම, අදාළ ඉතිරි ව්‍යාපෘති සම්බන්ධයෙන් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතනත් සමඟ සාකච්ඡා කිරීමට කොළඹ මහ නගර සභා නිලධාරීන් යොමු කිරීමට ද, කමිටු සභාපතිවරයා විසින් මෙහිදී කටයුතු කරන ලදී. එමෙන්ම, කොළඹ නගරය වැසි ජලයෙන් යට වීම වැළැක්වීම සඳහා ගත හැකි පියවර පිළිබඳ සැලසුමක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව කොළඹ නගර සභාව වෙත නිර්දේශ කළේය.

කාරක සභා පුවත්

# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගොස් සිටින නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ලබාදීමේදී පවතින ගැටලුව සති දෙකක් තුළ විසඳන්න. විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට උපදෙස්.



සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගොස් සිටින නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ලබාදීමේදී පවතින ගැටලුව අදාළ සියලු පාර්ශ්ව කැඳවා සති දෙකක් තුළ විසඳුමක් ලබාදීමට කටයුතු කරන ලෙස විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දෙන ලදී.

මේ පිළිබඳ කරුණු සාකච්ඡා වූයේ විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතාගේ සභාපතිත්වයෙන් මෑමස පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාවේ, විගණකාධිපති වාර්තාවේ කරුණු සළකා බැලීම සඳහා එම ආයතන වල නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීහු පිරිසක් කාරක සභාව හමුවට කැඳවා තිබුහ.




එහිදී කාරක සභා සභාපතිවරයා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ, විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීමට නොහැකිවූ නිලධාරීන්ට වැල් පොලී එකතුකර අදාළ දායක මුදල් ලබාදීමේ සිදුවීම ගැන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න කළේය. ඒ අනුව තම පනත ප්‍රකාරව තමන් කටයුතු කරන බව ඊට පිළිතුරු ලබාදුන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පවසන ලදී. කෙසේ වෙතත් 03/2008 චක්‍රලේඛය අනුව වැල් පොලී අය නොකර, විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීමට ගරු අධිකරණය විසින් ලබාදී ඇති නියෝගය අනුව කටයුතු කරන ලෙසට කාරක සභාව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට නිර්දේශ කරනලදී.

එමෙන්ම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගොස් සිටින නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් තවමත් නොලබන පිරිස් හට කලින් කාරක සභා රැස්වීමකදී ගත් තීරණයක් පරිදි ඔවුන්ගේ මුලික විශ්‍රාම වැටුප හෝ ගෙවීමට කටයුතු කරමින් සිටින බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීහු පැවසූහ.






කාරක සභා පුවත්

# ළමා මන්ද පෝෂණය සම්බන්ධව රාජ්‍ය ආයතන ඉදිරිපත් කරන තිබෙන සංඛ්‍යාමය වාර්තා වලින් රටේ පවත්නා සැබෑ තත්ත්වය අනාවරණය වෙන්නේ නැහැ - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වඩිවේල් සුරේෂ් මහතා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී පවසයි



ශ්‍රී ලංකාවේ ළමා මන්ද පෝෂණ තත්ත්වය වැඩි වෙමින් පවතින්නේද යන්න සොයා බැලීමටත්, එසේ නම් ඒ සඳහා ගත යුතු කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහාත්, හඳුනාගත් ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාවට නැංවීම පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහාත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වඩිවේල් සුරේෂ් මහතාගේ සභාපතිත්වයෙන් මෙමස පාර්ලිමේන්තුවේදී රැස්විය.

මේ අවස්ථාව සඳහා සෞඛ්‍ය අංශය නියෝජනය කරමින් රාජ්‍ය ආයතන ප්‍රධානීහු පිරිසක් සහභාගී වූහ.

මෙහිදී අදහස් දැක්වූ සභාපතිවරයා, ළමා මන්ද පෝෂණය සම්බන්ධව රාජ්‍ය ආයතන ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යාමය වාර්තා වලින් සැබෑ ලෙසම දිවයිනේ මන්ද පෝෂණ තත්ත්වයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව අනාවරණය නොවන බව පෙන්වා දුන්නේය



ඒ අනුව ළමා මන්ද පෝෂණය සම්බන්ධව පවතින නිවැරදිම දත්ත අයවැයට පෙර කාරක සභාව වෙත ලබාදීමට කටයුතු කරන ලෙසත් ඒ ඔස්සේ ළමා මන්ද පෝෂණය තුරන් කිරීම සම්බන්ධයෙන් පොදු යෝජනාවලියක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවකාශය සැළසෙන බවත් කාරක සභාව නිලධාරීන්ට පෙන්වා දෙන ලදී.

එහිදී වැඩි දුරටත් කරුණු පහැදිළි කළ කාරක සභා සාමාජිකයින් ශ්‍රී ලංකාව තුල මන්ද පෝෂණය මෙන්ම අධි පෝෂණ තත්ත්වයන් සම්බන්ධයෙන්ද නිවැරදි දත්ත වල අවශ්‍යතාව පෙන්වා දුන්හ.

දිවයින පුරා ත්‍රිපෝෂ ලබාදීමේ වැඩපිළිවෙළ පිළිබඳව කාරක සභාවේදී දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි. මේ වන විට වයස මාස 06ත් අවුරුදු 3ත් අතර දරුවන් සඳහා ත්‍රිපෝෂ නිකුත් කිරීම සිදු නොවන බවත් අවරුදු 3ත් 5ත් අතර දරුවන් සඳහා පමණක් ත්‍රිපෝෂ ලබාදීම කටයුතු කරන බව කාරක සභාව හමුවේ කරුණු දක්වමින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ නිලධාරීහු පැවසූහ. මාස 06ත් අවරුදු 3ත් අතර දරුවන් සඳහා ත්‍රිපෝෂ නිකුත් නොකිරීම පිළිබඳව කරුණු දැක්වූ එම සමාගමේ නිලධාරීහු, එම වයස් ඛාණ්ඩය සඳහා ත්‍රිපෝෂ නිෂ්පාදනයේදී අදාළ නිර්ණායකයන්හි පවතින ගැටලුවක් හේතුවෙන් ත්‍රිපෝෂ නිෂ්පාදන සිදු නොකරන බව පැවසූහ. කෙසේ වෙතත් සෞඛ්‍ය අමාත්‍යාංශය එම ගැටලුව නිරාකරණය කර දීමෙන් පසුව එම වයස් ඛාණ්ඩය සඳහාද ත්‍රිපෝෂ නිෂ්පාදනය කළ හැකි බව එම නිලධාරීහු පෙන්වා දුන්හ.



කාරක සභා පුවත්

# ශ්‍රී ලංකවේ ජාතික උරුමයන් සුරැකීම උදෙසා කඩිනමින් ක්‍රියාත්මක වීමට වැඩ පිළිවෙලක් අවශ්‍යයි - මහා සංඝරත්නය ඇතුලු පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ස්වෙච්ඡා සංවිධානවල ප්‍රධානීන් ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මවීම පිණිස වන

**■මෙරට ජාතික උරුමයන් සුරැකිම වෙනුවෙන් සැකසූ වාර්තා යටපත් කරල තියෙන්නේ - මහාචාර්ය පූජ්‍යපාද ඉඳුරාගාරේ ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ පවසයි**







ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මක වීම පිණිස වන පාර්ලිමේන්තු සංසදයේ සිව්වැනි සභාවාරය පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජයන්ත සමරවීර මහතාගේ සභාපතිත්වයෙන් මෙමස පාර්ලිමේන්තුවේදී පැවැත්විණි.

මෙම අවස්ථාව සඳහා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන ස්වාමීන් වහන්සේ, මහාචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස ස්වාමීන් වහන්සේ මෙන්ම පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ ස්වෙච්ඡාවෙන් කටයුතු කරණු ලබන සංවිධාන නියෝජනය කරමින්, මතුගම සෙනෙවිරුවන්, වෛද්‍ය වසන්ත බණ්ඩාර, හිටපු පුරාවිද්‍යා කොමසාරිස් මහාචාර්ය සේනරත් බණ්ඩාර දිසානායක, වෛද්‍ය ගාමිණී ජයවීර, මේජර් ජෙනරල් විජිත රවිප්‍රිය, සුනිල් චන්ද්‍රකුමාර, එස්.කේ. සේනානායක යන මහත්වරුන් සහභාගී වුහ.

ශ්‍රී ලංකාවේ ජාතික උරුමයන් හඳුනාගැනීම, සංරක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා උපාය මාර්ගික වැඩ පිළිවෙලක් සක් කිරීම වෙනුවෙන් මෙම පාර්ලිමේන්තු සංසදය ක්‍රියාත්මක වෙමින් පවතී.

පසුගිය සභාවාර වලදී මෙම සංසදය හමුවට රාජ්‍ය ආයතන හා නිලධාරීන් කැඳවා සාකච්ඡා කළ බවත් මේ වනවිට ශ්‍රී ලංකාවේ ජාතික උරුමයන් හඳුනාගැනීම,සංරක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම පිළිබඳව ඔවුන් යෝජනාවලියක් සකස්කරමින් සිටින බවත් සභාපතිවරයා සංසදය හමුවේ කරුණු දක්වමින් පැවසුවේය.

ඒ අනුව රාජ්‍ය ආයතන හා ස්වෙච්ඡා සංවිධානවල අදහස් හා යෝජනා එකතුවෙන් ශ්‍රී ලංකාවේ ජාතික උරුමයන් හඳුනාගැනීම, සංරක්ෂණය කිරීම හා කළමනාකරණය සඳහා එක් උපායමාර්ගික වැඩ පිළිවෙලක් සකස්කිරීම අවසන් අරමුණ බවට පත් ඇති බව සභාපතිවරයා වැඩි දුරටත් අදහස් දක්වමින් පවසුවේය.

ශ්‍රී ලංකාව තුල මේ වනවිට ලෝක උරුම ලෙස ස්ථාන 8ක් ප්‍රකාශට පත් කර ඇති නමුත් ජාතික උරුම ලෙස කිසිවක් ප්‍රකාශයට පත් කර නොමැති බව මෙහිදී අදහස් දක්වමින් සභාපතිවරයා පැවසුවේය. ඒ අනුව මෙතරම් ප්‍රෞඪ ඉතිහාසයක් හිමි ශ්‍රී ලංකාවේ ජාතික උරුම හඳුනාගනිමින් ඒවා සංරක්ෂණය කර කළමනාකරණ කිරීමේ දැඩි අවශ්‍යතාවය සභාපතිවරයා පෙන්වා දුන්නේය.





# ආබාධ සහිත පුද්ගලයින් පාර්ලිමේන්තු සංචාරයක



පාර්ලිමේන්තු ජායා ගැලරිය











# රත්නපුර සීවලී මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල සභාවාරය










මෙවර සටහන - එච්. ඊ. ජනකාන්ත සිල්වා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

**ඔක්තෝබර් 03 අඟහරුවාදා**

- මහජන ආරක්ෂක ආඥාපනත යටතේ මහජන සාමය පවත්වාගෙන යාම සඳහා සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයන් සක්‍රිය සේවයට කැඳවීමේ ආඥාව ප්‍රකාශයට පත්කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට දැනුම් දීම
- (අ) "**ගලහ හඳවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය**"; සහ
  (ආ) "**මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ**"
  ඉහත පනත් කෙටුම්පත් ද්විත්වය පාර්ලිමේන්තුවට පිළිගැන්වීම
- (අ) "**සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)**" සංශෝධිතාකාරයෙන්; සහ
  (ආ) "**මැතිවරණ (විශේෂ විධිවිධාන)**" සංශෝධන රහිතව ඉහත පනත් කෙටුම්පත් ද්විත්වය පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම
- සමථ මණ්ඩල (විශේෂ ආරාවුල්) පනත යටතේ **නියෝග පාර්ලිමේන්තුව විසින් යථා පරිදි අනුමත කිරීම**
- අධිකරණ සංවිධාන පනත යටතේ **නියමය පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම**
- "**ළමයින් සඳහා සුරක්ෂිත අනාගතයක් සහතික කිරීම**" පිළිබඳව සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

**ඔක්තෝබර් 04 බදාදා**

- "**මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ**" පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක පිටපත් කථානායකවරයා වෙත ලැබී තිබෙන බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
- ජාතික විගණන පනත යටතේ සකස් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2024 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව සභාගත කර රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කිරීම
- ඖෂධ හිඟය සහ වෛද්‍ය හා සෞඛ්‍ය සේවක හිඟය පිළිබඳ පාර්ලිමේන්තුවට අමාත්‍යාංශ නිවේදනයක් කිරීම
- IMF විස්තීර්ණ ණය පහසුකම යටතේ වන දෙවැනි වාරිකය පිළිබඳ පාර්ලිමේන්තුවට අමාත්‍යාංශ නිවේදනයක් කිරීම
- "**ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර**" පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම
- රේගු ආඥාපනත යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් **යෝජනා සම්මතයන් ද්විත්වය පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම**
- විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් **නියමයන් හතර පාර්ලිමේන්තුව විසින් යථා පරිදි අනුමත කිරීම**
- විගණකාධිපතිවරයාගේ විශ්‍රාම වැටුප් හිමිකම සහිත මාසික දීමනාව වැඩිකිරීම සම්බන්ධ තීරණය **පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම**

**ඔක්තෝබර් 05 බ්‍රහස්පතින්දා**

- "**විසර්ජන (2024)**" පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම
- (අ) "**ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන)**"; සහ
  (ආ) "**සිවිල් ගුවන් සේවා (සංශෝධන)**" පනත් කෙටුම්පත් ද්විත්වය පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම
- සිවිල් ගුවන් සේවා පනත යටතේ **නියෝග ද්විත්වය පාර්ලිමේන්තුව විසින් යථා පරිදි අනුමත කිරීම**

■ නැව් නියෝජිතයන්ට නැව් බඩු ගෙන යන්නන්ට යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත යටතේ **නියෝග පාර්ලිමේන්තුව විසින් යථා පරිදි අනුමත කිරීම**
■ ශ්‍රී ලාංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන **පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ නාමය ඉවත් කර සංශෝධනය කිරීම පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම**
■ **"ආහාර ද්‍රව්‍ය සඳහා ප්‍රමිතීන් නිර්දේශ කිරීම"** පිළිබඳව සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

### ඔක්තෝබර් 06 සිකුරාදා

■ **"මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ"** පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක පිටපත් කථානායකවරයා වෙත ලැබී තිබෙන බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
■ **"ආර්ථික අර්බුදය හේතුවෙන් සිදුවන බුද්ධි ගලනය"** පිළිබඳව සභාව කල්තැබීමේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

### ඔක්තෝබර් 09 සඳුදා

■ **"ආයුර්වේද (සංශෝධන)"** පනත් කෙටුම්පත **2023 අංක 19 දරන පනත** වශයෙන් සහතිකය සටහන් කිරීම

### ඔක්තෝබර් 17 අඟහරුවාදා

■ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රී නසීර් අහමඩ් මහතා එම පක්ෂ සාමාජිකත්වයෙන් පහ කිරීමෙන් ඇති වූ මන්ත්‍රී පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වූ **ගරු අලි සාහිර් මෞලානා සෙයියඩ් මහතා නීති ප්‍රකාරව කථානායකවරයා ඉදිරියේ ප්‍රතිඥා දී මන්ත්‍රී නාම ලේඛනයේ අත්සන් තැබීම**
■ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රී නසීර් අහමඩ් මහතා එම පක්ෂ සාමාජිකත්වයෙන් පහ කිරීම නිසා මන්ත්‍රී ධුරය අවසන්වීම පිළිබඳ පාර්ලිමේන්තුවට දැනුම්දීම
■ **"මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ"** පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම් තිහක පිටපත් කථානායකවරයා වෙත ලැබී තිබෙන බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
■ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඇසීමට සහ ඊට පිළිතුරු සැපයීමට මිනිත්තු 15 කාලයක් පමණක් වෙන් කිරීමට කරන ලද තීරණය පාර්ලිමේන්තුවට දැනුම් දීම
■ **"ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය"** පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම
■ **"පාස්කු ඉරුදින මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය පිළිබඳව බ්‍රිතාන්‍යයේ "චැනල් 4" නාළිකාව විසින් විකාශය කරන ලද වැඩසටහන මගින් එල්ල කරන චෝදනා විමර්ශනය කිරීම සඳහා වන විශේෂ කාරක සභාව"** පත් කිරීම පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම
■ **"බලපිටිය ශ්‍රී රාහුලාරාම විහාරස්ථ සාමණේර ආකල්ප සංවර්ධන භික්ෂු විද්‍යාලය (සංස්ථාගත කිරීමේ)"** පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම
■ **"ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)"** පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සහ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පාර්ලිමේන්තුව විසින් යොමු කිරීම
■ **"ශත සංවත්සරය සමරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක්"** පිළිබඳ සභාව කල් තැබීමේ විවාදයක් පැවැත්වීම
■ **"සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)", "මැතිවරණ (විශේෂ විධිවිධාන)", "ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර", "ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන)" සහ "සිවිල් ගුවන් සේවා (සංශෝධන)"** පනත් කෙටුම්පත් පහට පිළිවෙළින් **2023 අංක 20, 21, 22, 23 සහ 24 දරන පනත්** වශයෙන් සහතිකය සටහන් කිරීම

### ඔක්තෝබර් 18 බදාදා

■ **"නාවික හමුදා"** පනත යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජල විද්‍යාව සහ නාවික සිතියම් විද්‍යාව පිළිබඳ විශේෂඥතාවය ඇති සාමාජිකයන්ට **"වෙළඳ නැව්"** පනත යටතේ වෙළඳ නැව් (යාත්‍රා කිරීමේ සුරක්ෂිත බව) නියෝග සහ **"ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන"** පනත යටතේ විධිවිධාන සලසා ඇති නාවික නොවන රාජකාරි ලෙස එකී ජල විද්‍යාත්මක ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා නිකුත් කර ඇති **ආඥාව පාර්ලිමේන්තුවට දැනුම් දීම**
■ **"ත්‍රස්ත විරෝධී"** පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන ලද බවට **පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම**
■ "මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ" පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම් දොළහක පිටපත් කථානායකවරයා වෙත ලැබී තිබෙන බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
■ **"පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)"** පනත් කෙටුම්පත පිළිබඳ **පාර්ලිමේන්තුවේ** ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව **පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රී රාජවරෝදියම් සම්බන්දන් මහතාට මාස තුනක කාලයක් සඳහා පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට පැමිණ නොසිටීමට පාර්ලිමේන්තුව විසින් අවසර ලබාදීම
- "මුදල්" පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම
- "**ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ**" දෙවැනි වර කියවීම සහ සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවීම පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම
- අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග ද්විත්වය පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම
- "**ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ** BL - 2 **විභාගය ඉංග්‍රීසි මාධ්‍යයට සීමාකිරීම**" පිළිබඳව සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

ඔක්තෝබර් 19 බ්‍රහස්පතින්දා

- "**මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ**" පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් කථානායකවරයා වෙත ලැබී තිබෙන බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
- රේගු ආඥාපනත යටතේ තීරු බදු සම්බන්ධයෙන් නියෝග, යෝජනා සම්මතය සහ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් නියමයන් තුනක්, මුදල් පනත යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් නිවේදන දෙකක්, සුරාබදු ආඥපනත යටතේ නිවේදන දෙකක්, පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම

ඔක්තෝබර් 20 සිකුරාදා

- "**ජාතික ජලශාස්ත්‍රීය**" සහ "**දූෂණ විරෝධී**" පනත් කෙටුම්පත් දෙක පාර්ලිමේන්තුවට පිළිගැන්වීම
- සමාගම් පනත යටතේ නියෝග, මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනත යටතේ නිවේදනය සහ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම
- "**ගාසාහි සටන් විරාමයක් සඳහා ඉල්ලීම සහ ඊශ්‍රායල-පලස්තීන ගැටුමට සාමකාමී විසඳුමක්**" පිළිබඳ යෝජනාව විවාද කර පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම


# පාර්ලිමේන්තු විත්ති

**පුවත් හසුන I 40 වැනි කාණ්ඩය I ඔක්තෝබර් I 2023**

**ISSN 2806 – 5425**

**සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka
@ParliamentLK
@slparliament
Parliament of Sri Lanka